**IPRC/16/44**

# ප්‍රාන්ස් කෆ්කාගේ කතා කලාවේ දේශපාලන මුහුණුවර

රෂිකලා ලසිකා *

විශ්ව කීර්තිධර කතුවරයකු වූ ප්‍රාන්ස් කෆ්කාගේ (1883 - 1924) කතා කලාවේ දේශපාලන මුහුණුවර පිළිබඳ ඔහුගේ ප්‍රකට කෙටිකතාවක් වූ 'රූපාන්තරණය' (The Metamorphosis) ඇසුරින් අධ්‍යයනය කිරීම මේ පර්යේෂණයේ අරමුණයි. යථාර්ථවාදී කතා රීතිය අතික්‍රමණය කළ, අධියථාර්ථවාදී සහ නූතනවාදී සාහිත්‍ය ප්‍රවණතාව වර්ධනය කළ ලේඛකයකු වශයෙන් ප්‍රකට වූ ප්‍රාන්ස් කෆ්කාගේ නිර්මාණ අරභයා විවිධ විචාර ධාරාවන් ගොඩනැගුණේ ය. විශේෂයෙන් ම ඔහුගේ The Trial සහ Metamorphosis යන නිර්මාණ පදනම් කරගෙන විචාර ඉදිරිපත් කළ ඇතමුන් ඔහු ව හැඳින්වූයේ පුද්ගල හුදෙකලාව, හුදෙකලාවේ ශාපය පිළිබඳ ලියූවකු වශයෙනි. එහෙත් ඔහුගේ කෘති අධ්‍යයනයේ දී කෆ්කා හුදෙක් පුද්ගල හුදෙකලාව පමණක් කතා කළ කතුවරයකු නොවන බව පෙනී යයි. පුද්ගල, සමාජ, දේශපාලන සහ ආර්ථික පරිසරයත්, එහි සංකීර්ණ තත්ත්වයන් පිළිබඳවත් ගැඹුරු කතිකාවක් ඔහුගේ නිර්මාණවල යටිපෙළ අරුතක් සේ සාකච්ඡාවට ලක් කෙරේ.

'රූපාන්තරණය' මඟින් සහ එහි ප්‍රධාන චරිතය ඇසුරින් කෆ්කා මතුකරන දේශපාලන මුහුණුවර වශයෙන් විශේෂයෙන් හඳුනාගත හැකි වන්නේ අධම ධනවාදයේ එක් ප්‍රතිඵලයක් වූ නිලධාරීවාදය සහ කාර්යාලයීය ජීවිතයයි. සමාජවාදී විචාර සිද්ධාන්ත ඔස්සේ සලකා බලන කල ධනවාදයේ බිහිසුණු බව, අයුක්තිය, අසාධාරණය සහ නීති පද්ධතිවල ඇති දුර්වල තැන් පිළිබඳ මතුකරන දේශපාලන දර්ශනයක් මෙහි දී ඉස්මතු කෙරේ. එහෙත් මිලාන් කුන්දේරා වැනි විචාරකයෝ මේ තත්ත්වය හඳුනා නොගනිති. ඒ අනුව මෙම අධ්‍යයනය මඟින් සිදු කෙරෙන්නේ ප්‍රාන්ස් කෆ්කා මතු කළ දේශපාලන යථාර්ථය රූපාන්තරණය ඇසුරින් විග්‍රහ කිරීමයි. රූපාන්තරණය නම් වූ කෙටිකතාව ඇසුරින් රූප විපර්යාසයකට ලක්වන පුද්ගලයකු පිළිබඳ අධියථාර්ථවාදී ප්‍රතිනිර්මාණයක් සිදුවේ. කෆ්කා දේශපාලන කතිකාවක් ගොඩනගන්නේ එකී ප්‍රතිනිර්මාණ ක්‍රමයේ ම යටිපෙළ අරුතක් වශයෙනි. මේ පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රයක් වශයෙන් The Metamorphosis කෘතියේ සිංහල පරිවර්තනය 'රූපාන්තරණය' සහ කෆ්කාගේ නිර්මාණ අරභයා ගොඩනැගුණු විචාර ආශ්‍රය වේ.

***ප්‍රමුඛ පද :*** *ප්‍රාන්ස් කෆ්කා, රූපාන්තරණය, පුද්ගල හුදෙකලාව, දේශපාලන යථාර්ථය, අධියථාර්ථවාදය*

*rashikala06@gmail.com